**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතිවලට වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇතිබව මා දරන්නාවූ මතයවේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරනය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස , කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම,අදාල වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම,කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශවීම,සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් " මනා ලෙස සැලසුම් කරන ලද " අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සඳහා ප්‍රධාන ගිණුම්කරණ වාර්තා ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 2245/31 හා 2021 සැප්තැම්බර් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම සභාව වෙත රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කර තිබූ රු.72,177,176 ක් වූ රක්ෂණ දායකත්වය පිළිබඳ නිවැරදිතාවය තහවුරු වන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | සියලු රක්ෂණ ආයතන නියෝජිතයන් සමඟ සාකච්ඡා කර රක්ෂණ ආයතන විසින් ලබා දෙන රක්ෂණ මුදල් නිවැරදි බවට ආයතනයේ අභ්‍යන්තර විගණකගේ හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකුගේ තහවුරුවක් සමඟ ලබා දෙන ලෙස දන්වන ලදි. | අදාල රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කරනු ලබන මුදල් වල නිවැරදි භාවය තහවුරු කර ගැනීම සඳහා අදාල ආයතනයන් වල සහතික කල මූල්‍ය ප්‍රකාශ ලබා ගත යුතුවේ. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය තුල දී සභාව වෙත ලැබී තිබූ මාර්ග සංඥා පුවරු වෙනුවෙන් ගෙවිය යුතු රු6,586,736. කට අදාලව ගිණුම් වල වෙන්කිරීම් කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ වියදම් හා වගකීම් ඒම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | අතපසු වීමකින් 2022 වර්ෂයට අදාල වියදමක් ලෙස සැලකිල්ලට නොගෙන ඇති අතර එම වරද 2023 මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාල වියදම් සහ වෙන් කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ස්ථාවර තැන්පතුවල වටිනාකම රු 186,550,001.ක් වුවද මූල්‍ය තත්ව ප්‍රකාශයේ එය රු 185,167,087.ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ස්ථාවර තැන්පතුවල වටිනාකම රු 1,382,914.ක් අඩුවෙන් දක්වා තිබුණි. | නැවත ආයෝජනය වූ (Reinvest) රු.1,382,914 ක පොළී ආදායම අත් වැරදීමකින් 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සැලකිල්ලට නොගෙන ඇති අතර එම වරද 2023 මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු14,008,316. ක් වුවද එය රු.13,320,837 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.687,479 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් පිළියෙල කිරීමේදී ස්ථාවර තැන්පතු පොළී ආදායම් කිහිපයක් සැලකිල්ලට නොගැනීම නිසා වර්ෂයේ ස්ථාවර තැන්පත් පොළිය අඩුවෙන් ගිණුම් ගත කර ඇති අතර එය 2023 මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ | වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළිය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ . |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු 7,348,671. ක් වුවද එය මූල්‍ය තත්ව ප්‍රකාශයේ රු 8,043,476.ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු 694,805.ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් අංක 204-60-01-00026713-3 ට අදාළව 2022.12.31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම වැඩියෙන් ගණනය කර ඇති අතර එය 2023 මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**1.6 නීති රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ ආදියට අනුකූල නොවීම.**

| **නීති, රීති රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>• 4.2.6 වගන්තිය | කාර්තු , අර්ධවාර්ෂික , වාර්ෂික වශයෙන් ආයතනයේ කාර්ය සාධනය වාර්තා සමාලෝචනය කලයුතු වුවද සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා නොතිබුණි | අභ්‍යන්තර ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමේදී රැස්වීම් වාර්තා පවත්වා නොගත් අතර , රජයේ විගණන අංශය මඟින් 2022.09.15 දින කරන ලද පැහැදිලි කිරීමට අනුව , 2022.09.15 දින සිට එම වාර්තා පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| ● 5.1.3 වගන්තිය | මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර අදාල ආයතනය වෙත යොමු කල යුතුය වුවද 2022 ක්‍රියාකාරී සැලැස්ම සඳහා සභාව විසින් අනුමැතිය ලබාදී තිබුනේ 2022 මාර්තු 30 දින දීය. | ක්‍රියාකාරී සැලැස්ම 2022.12.29 දින සභා පත්‍රිකා අංක 2021-17/06-01 මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර 2022.01.04 වන දින අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර එහිදී සංශෝධනයන් සිදුකිරිමෙන් අනතුරුව MT/05/03/01-2022 මඟින් 2022.04.25 දින ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලැබී ඇත.ඉදිරියේදී ඔබ විසින් සඳහන් කරන ලද 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛයට අනුව කටයුතු කරන බව තවදුරටත් දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| ● 8.8 වගන්තිය | මු.රේ 135 යටතේ මුල්‍ය බලතල පැවරීම වර්ෂය ආරම්භයේ සිදුකල යුතු වුවද එය අනුමත කර තිබුනේ 2022 මාර්තු 30 දිනදීය. | 2021.12.29 දින ජාතික සභාවේ අනුමැතිය ලැබී සංශෝධනයන් සිදුකිරිමෙන් අනතුරුව MT/04/11/02/RS 2022.05.25 දිනැති ලිපිය මඟින් අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ලබා දෙන ලදි.2023 බලය පැවරීමේ ලේඛණය සඳහා 2022.10.27 දින ජාතික සභාවෙන් අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව , 2023.01.09 වන දින අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ලබා දී ඇති අතර , ඉදිරියේදීත් නියමිත පරිදි ජාතික සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.69,109,561 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.25,504,993 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.43,604,568 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වන රක්ෂණ සමාගම්වලින් ප්‍රේෂණය වන ආදායම සියයට 1 සිට සියයට 2 දක්වා වර්ධනය වීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම ආදායම රු.20,457,431 කින් ද ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතයන් සමාලෝචිත වර්ෂයේදී ඉහළ යාම හේතුවෙන් එම පොළී ආදායම රු.36,308,696 කින් ද වැඩි වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව වියදම් රු.13,161,557 කින් වැඩි වී තිබූ අතර ඒ සඳහා අනතුරු සිදු කර පලායෑම් සඳහා වන්දි ගෙවීම් රු.10,725,000කින් වැඩි වීම සහ ආයතනයේ වත්කමක් ලෙස පැවතුණු රු.3,803,686ක ශුද්ධ වටිනාකමකින් යුතු රියදුරු පුහුණු උපකරණය වෙනත් ආයතනයකට පරිත්‍යාග කිරීම විශේෂයෙන් හේතු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂය තුළදී රක්ෂණ ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 40ක වර්ධනයක් ද ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් ආයෝජනයෙන් ලද පොළී ආදායම සියයට 164කින් වර්ධනයක් ද වීම හේතුවෙන් සභාවේ සමස්ත ආදායමේ වර්ධනය සියයට 77ක් වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදමේ වැඩිවීම සියයට 27ක් වූ අතර ඒ සඳහා මාර්ග අනතුරු සඳහා වන්දි ගෙවීම සියයට 168කින් වර්ධනය වීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂන් සභාවක් ලෙස ස්ථාපනය කිරීම ප්‍රධාන අරමුණ කොට ගෙන ජාතික සභාව පිහිටුවා වසර 17ක් ගත වී ඇතත් 2023 ජනවාරි 24 වන දිනය දක්වාම එය කොමිෂමක් ලෙස ස්ථාපිත කර නොතිබූ අතර මේ හේතුවෙන් මෙම සභාවේ කාර්යයන් ඉටු කිරීමට නීතිමය බලතල ලැබී නොතිබුණු අතර විධිමත් කාර්ය මණ්ඩලයක් ද පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ජාතික ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව ලෙස ස්ථාපිත කිරීමට අදාලව සකස් කරන ලද පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමෙන් අනතුරුව, නිතී කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධන සහිතව 2022.03.29 දින හා 2022.05.18 දින නැවත ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් අනතුරුව නිතී කෙටුම්පත් සම්පාදක වෙත යොමුකරන ලදි.2022.12.16 | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම ස්ථාපිත කළ යුතු වේ . |

| | | | |
|---|---|---|---|
| | | වන දින රාජ්‍ය අමාත්‍යතුමා විසින් ලබාදුන් උපදෙස් අනුව පනත් කෙටුම්පත නැවත සංශෝධනය කර 2022.12.16 දින අතිරේක ලේකම් (සංවර්ධන ii) විසින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සමඟ නීති නිලධාරී වෙත යොමුකර ඇත. | |
| (ආ) | සභාවේ ජංගම ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 45ක මුදලක් පැවති අතර සභාවේ ආදායම් ලැබීම්වලින් මාසිකව වියදම් දැරීමට තරම් මුදල් ප්‍රමාණයක් රදවා ගනිමින් අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට ආයතනය සතුව ජංගම ගිණුමේ රු.47,858,688ක ශේෂයක් පැවතුණි. | ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කල යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී රක්ෂණ ආයතනවලින් රු.72,177,176 ක දායක මුදල් ලැබී තිබූ අතර ඉන් රු.17,100,000 ක් වන්දි වශයෙන් ගෙවා තිබූ අතර එම මුදල දායක මුදල් ලැබීම්වලින් සියයට 24 ක ප්‍රතිශතයක් විය. ශ්‍රී ලංකාව තුල සිදුවන වාහන අනතුරු සම්බන්ධයෙන් සලකා බැලීමේදී වන්දි මුදල් ලබාගැනීම සම්බන්ධව මහජනතාවගේ නොදැනුවත්භාවය මීට හේතු වී ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | වාහන අනතුරු සම්බන්ධයෙන් සළකා බැලීමේදී වන්දි මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් ජනතාවගේ නොදැනුවත්භාවය මීට හේතු වී ඇත. | වන්දි ලබා දීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම කලයුතු වේ. |
| (ආ) | අංක 2245/31හා 2021සැප්තැම්බර් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 2වගන්තිය ප්‍රකාරව සියයට 2ක රක්ෂණ දායකත්ව මුදල් අයකර ගතයුතු වුවද පෞද්ගලික රක්ෂණ ආයතන 2ක් සියයට 1ක දායකත්ව මුදලක් පමණක් ගෙවා තිබූ අතර අනෙක් සියයට 1ක මුදලට අදාල රුපියල් 1,262,404 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙ සම්බන්ධයෙන් අදාල රක්ෂණ ආයතන දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර,එම ආයතන වෙතින් අදාල මුදල් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ලබා ගැනීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදි රක්ෂණ ආදායම් ආයතනයට ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක (4) 01/2014 (ඇ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ අදාල භාණ්ඩ ,සේවා සහ විවිධ ව්‍යාපෘති ඉටු කිරීම වෙනුවෙන් රු.මිලියන 335.14ක් වෙන් කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විට එම සැලැස්මේ රු.මිලියන 186.8 කට අදාල ප්‍රසම්පාදන කටයුතු 09ක් ඉටු කර නොතිබුණි. | රු.මි 150 ක ඇස්තමේන්තුගත මුදලක් වෙන්කර ඇති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝගයක් ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබා දීම සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදන කටයුතු ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි.<br>රු.මි.2.7ක ව්‍යාපෘති 2ක 2022.08.18 දින සිදුකරන ලද සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කරන ලද නව ව්‍යාපෘතීන් වන අතර,සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම,ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ලේඛණය සඳහා ජාතික සභාවේ අනුමැතිය ලැබීමෙන් අනතුරු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කරන ලද අතර,ඒ සඳහා 2022.11.02 දින අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා දෙන ලදි.එබැවින් 2022 වර්ෂය අවසාන වීමට පෙර එම ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි විය.රු.මි.27.6 ක ව්‍යාපෘති 2022.08.18 දින ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමේ දී ඉවත් කරන ලදී.රු.මි. 6.5ක ව්‍යාපෘති 2022 වර්ෂයේදී පැවති ආනයන සීමා කිරීම් හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොමැත. | සැලසුම් ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය විධිවිධාන සලසා ගැනීම කලයුතු වේ. |

**3.4 මානව සම්පත් කළමනාකරණය.**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඇ) වගන්තිය ප්‍රකාරව සභාවේ සංවිධාන ව්‍යුහය හා අනුමත කාර්ය මණ්ඩල භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල යුතු වුවද මෙතෙක් මෙම ආයතනය කොමිෂන් සභාවක් ලෙස ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරින් 14 දෙනෙකුද, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරින් 4 දෙනෙකුද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධාරියෙකු ද ලෙස නිලධාරින් 19 දෙනෙකු අනුයුක්ත කර අදාල රාජකාරි ඉටුකර ගෙන යමින් පැවතුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂන් සභාවක් ලෙස ස්ථාපිත කිරිමෙන් අනතුරුව නියමිත කාර්ය මණ්ඩලයක් අනුමත කර ගැනිම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | සභාව සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගැනීමට කටයුතු කලයුතු වේ. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලන**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ගිණුම් කාරක සභාව විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේ ජූලි මස සංශෝධිත අයවැය ලේඛනයක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර අධික වේගය නිසා සිදු වන මාර්ග අනතුරු අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබූ අතර, 2022වර්ෂයේදී අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 150ක ප්‍රතිපාදනයන් වෙන් කර තිබුණද තාක්ෂණික උපකරණ මිලදී ගැනිම සඳහා සිදු කළ යුතු ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. ඒසේම ඉකුත් වර්ෂයේදීද ඉහත නියෝගය අනුව මෙම කාර්යය ඉටු කර නොතිබුණි. | සම්මත ලංසු කැඳවීමේ ලේඛන සකස් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත භාර දී ඇත. ප්‍රගති සමාලෝජන රැස්වීමේදී රාජ්‍ය ගරු අමාත්‍යතුමා විසින් උපදෙස් ලබා දෙන ලද්දේ මෙම කාර්ය ඉටු කිරීමට පෙර ඒහි ඵලදායීතාවය සම්බන්ධයෙන් යලි සමාලෝචනය කිරීමෙන් අනතුරුව අදාල භාණ්ඩ මිලදී ගැනීම සිදු කරන ලෙසයි. | ගිණුම් කාරක සභා නියෝගය ක්‍රියාත්මක කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2018 සහ 2019වර්ෂවලදී සභාවට රු.මිලියන 1.7ක් ප්‍රේෂණය කර තිබූ අතර 2022 වර්ෂය අවසානය දක්වාම එම මුදල් භාවිතා කර කිසිදු ව්‍යාපෘතියක් ඉටු කර නොතිබුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා ජාතික සභා අරමුදලෙහි ඇති මුදල් උපයෝගී කර ගනු ලබයි.ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට යොමු කරන ලද මුදල් යම් නිශ්චිත ව්‍යාපෘතියක් සඳහා යොමු නොකරන ලද නිසා එම මුදල් ජාතික සභා අරමුදලට බැර කර ඇති බව දන්වා සිටිමි. | විදේශ ආධාරය උපරිම ඵලදායක ලෙස උපයෝජනය කළ යුතු වේ. |

**4.2 විගණන කමිටුව.**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ජුනි 29 දිනැති අංක DMA/2009/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එවැනි රැස්වීම් වාර 01 ක් පමණක් පවත්වා තිබුණි. | ගැටළු මගහරවාගෙන විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වන බව වැඩිදුරටත් සඳහන් කරමි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වීම |

**4.3 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1971 අංක 38 දරණ මුදල් පනතේ 8(1) වගන්තිය හා PED 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට ප්‍රථම අයවැය ලේඛනය අනුමත කල යුතු වුවද සභාව විසින් මුදල් වර්ෂය ආරම්භ වී 2022 මාර්තු 30 දින අයවැය ලේඛනය අනුමත කර තිබුණි. | අයවැය ලේඛනය 2021.12.29 දින සභා පත්‍රිකා අංක 2021-17/06-01 මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර,ඒ සඳහා ජාතික සභාවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව 2022.04.25 දින අමාත්‍යාංශය ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත.2023 වර්ෂය සඳහා සකස් කරන | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

| | | |
|---|---|---|
| | ලද අයවැය ලේඛණය සඳහා 2022.10.27 දින ජාතික සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අදාල පාර්ශව වෙත යොමු කිරීමට කටයුතු කරන ලද බව වැඩිදුරටත් දන්වා සිටිමි. | |

**4.4 තිරසර සංවර්ධන අරමුණු.**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන් 03 ක් මාර්ග ආරක්ෂාවට අදාලව හඳුනා ගෙන තිබුනද විගණන දින වන විටත් 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/5P/5dg/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයට අදාලව තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි | මාර්ග ආරක්ෂාව ජාතික සභාව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් ලෙසට ක්‍රියාත්මක වන ආයතනයක් බැවින් ආයතනයට අදාලව සුවිශේෂී සංවර්ධන සැලැස්මක් මේ වන තෙක් සකස් කර නොමැති අතර, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය මහින් සකස් කරන තිරසාර සංවර්ධන සැලැස්ම සඳහා මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ඇතුළත් විය යුතු කරුණු පිළිබඳව අමාත්‍යාංශයට අවශ්‍ය සහයෝගය මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මගින් ලබා දීමට කටයුතු කරයි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගෙන සැලසුම් සකස් කල යුතු වේ. |